**ශීර්ෂය - 25 - සීමා නීර්ණය කොමිෂන් සභාව**

---------------------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

සීමා නීර්ණය කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2022 ජුනි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත නිකුත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොමිෂන් සභාවේ 2020 හා 2021 වර්ෂවල භාණ්ඩාගාරයට සිදුකළ ප්‍රේෂණ පිළිවෙලින් රු.22,719 ක් හා රු.141,663 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | 2021 නොවැම්බර් 21 දිනැති අංක 2021/03 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු අතර 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ද ඒ අනුව දැක්විය යුතු වුවත් කොමිෂන් | ඉදිරි වර්ෂවලදී සංසන්දනාත්මකව හා නිවැරදි අගයන් ඇතුළත් කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | අග්‍රිම ශේෂය සැසඳුම් ප්‍රකාශයේ ශේෂය සමඟ සැසඳිය යුතු අතර 2020 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නිවැරදිව දැක්විය යුතු |

| | | |
|---|---|---|
| සභාවේ ප්‍රවර්ථන වර්ෂයේ අග්‍රිම ශේෂය එලෙස සැසඳුම් ප්‍රකාශයේ ශේෂය සමඟ නොසැසඳුණි. 2020 වර්ෂයේ සංසන්දනාත්මක අගයන්ද නිවැරදිව දක්වා නොතිබුණි. | | වේ. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | කොමිෂන් සභාව විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ගාස්තු, අත්තිකාරම් අයකර ගැනීම් හා තැන්පතු ලැබීම් ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය නිවැරදි නොවුණි. තවද, 2020 වර්ෂය සඳහා වූ නැවත ගලපන ලද ගිණුම් ඉදිරිපත් කිරීමේදීද මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීම සඳහා ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ගාස්තු, අත්තිකාරම් ලැබීම් හා තැන්පතු ලැබීම් ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී මුදල් ප්‍රවාහය ගණනය කිරීමට අදාල සියළුම අගයන් ඇතුළත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | කොමිෂන් සභාවේ පුද්ගලික පඩි නඩි සහ මෙහෙයුම් වියදම් රු.11,116,932 ක් වුවත් විගණනයට ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.10,618,856 ක් ලෙස දක්වා තිබුණි. තවද, කොමිෂන් සභාවේ නැවත ගලපන ලද 2020 වර්ෂය සඳහා වූ පුද්ගල පඩිනඩි සහ මෙහෙයුම් වියදම නිවැරදිව මුදල් ප්රවාහ ප්‍රකාශය තුල ගලපා නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී මුදල් ප්‍රවාහය ගණනය කිරීමට අදාල සියළුම අගයන් ඇතුළත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (iii) කොමිෂන් සභාව විසින් රු.6,400 ක් වෙනත් වැය ශීර්ෂයන් වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂයේදී දරා තිබුණද එය නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. තවද, 2020 වර්ෂය සඳහා වූ නැවත ගලපන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම, ඇතුළත් කර නොතිබුණි. | වෙනත් වැය ශීර්ෂයන් වෙනුවෙන් දරන ලද වියදම් නිවැරදිව ඇතුළත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

## 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුදලින් හර කිරීම් රු.99,300 ක් වුවද වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ හර කිරීම් ලෙස වර්ෂයේ ආරම්භක ශේෂයද ඇතුළත්ව රු.978,857 ක් ලෙස දක්වා තිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | නිවැරදිව ශේෂයන් දැක්විය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

## 2.1 වියදම් කළමනාකරණය

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.150,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් අදාල වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

**විගණන නිරීක්ෂණය**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එකඟ වේ. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් 2017 හා 2018 වර්ෂවලදී අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් ඉදිරිපත් කර තිබුණද ඒ සඳහා අනුමැතියක් ලැබී නොතිබුණු බැවින් විගණිත දිනය දක්වාම පනතක් පිළියෙල කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | පනත සකස් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් 2016 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ කටයුතු සඳහා යොදාගෙන තිබුණි. විගණිත දිනය වන 2022 ජනවාරි 31 දින දක්වාම මෙම වාහන දෙක කොමිෂන් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් විමසා ඉදිරි කටයුතු කරන බව දන්වමි. | එම වාහන කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කොමිෂන් සභාවේ කාර්යභාරය හා බලතල සම්බන්ධයෙන් පැහැදිළි කර නොතිබුණද කොමිෂන් සභාව වෙත විසර්ජන පනතින් 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 13.32 ක් හා රු. මිලියන 14.22 ක් වෙන් කරදී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.මිලියන 12.08 ක් හා රු. මිලියන 11.13 ක් වැය කර තිබුණි. | නිශ්චිත කාර්යභාරයක් පවරා දෙන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කර ඇත. | කොමිෂන් සභාවට නිශ්චිත කාර්යභාරය හා බලතල පැවරීමක් සිදු කළ යුතු වේ. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 පෙබරවාරි 05 දින අංක DMS/1029 ලිපියෙහි කොමිෂන් සභාව වෙත තනතුරු 15 ක් අනුමත කර තිබුණු අතර, 2021 දෙසැම්බර් 31 දිනට ඉන් තනතුරු 05 ක් පුරප්පාඩු පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා 2016 වර්ෂයේ සිට වැඩබැලීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි. | එකඟ වෙමි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |